④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2490/03 - 2026 මැයි මස 25 වැනි සඳුදා - 2026.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MOR/LAN/01/F1/214 (වෙළුම IV).
*නාගරික සංවර්ධන අධිකාරියේ අංකය* : 10/2/1805.

නාගරික සංවර්ධන අධිකාරිය වෙත කටුබැද්ද පිහිටි දෙල්ගහවත්ත *නොහොත්* බැටරිවත්ත ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුබැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2026.03.12 දිනැති කැඩැස්තර සිතියම් අංක 520205 කලාප 01 පත්‍ර අංක 34 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.5366 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම :

01. කැබලි අංක **04**
ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0430.

02. කැබලි අංක **05**
ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0293.

03. කැබලි අංක **06**
ඉඩමේ නම: දෙල්ගහවත්ත *නොහොත්* සපුගහවත්ත වරිපනම් අංක - නොදනී, ශ්‍රී රාහුල මාවත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0006.

04. කැබලි අංක **09**
ඉඩමේ නම: දෙල්ගහවත්ත *නොහොත්* සපුගහවත්ත වරිපනම් අංක - නොදනී, ශ්‍රී රාහුල මාවත; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 1.2990.

05. කැබලි අංක **10**
ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0695.

06. කැබලි අංක **13**
ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0102.

07. කැබලි අංක **14**
ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: ඇළ මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0820.

08. කැබලි අංක **15**
ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0030.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 ජූනි මස 18 වැනි දින පෙ. ව. 10.00 ට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 ජූනි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එස්. පී. කිරිවත්තුඩුව,**
ප්‍රාදේශීය ලේකම්,
මොරටුව.

2026 මැයි මස 21 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0233

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.